# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 25 දරන (අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල) බලතල පැවරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1974 ජූලි මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1974 අගෝස්තු මස 01 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 25 දරන (අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල) බලතල පැවරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1974 ජූලි මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 58/73.

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ බලතල ඇතැම් පළාත් පාලන ආයතනවලට පැවරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද 1961 අංක 32 දරන අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල පනත සහ 1969 අංක 28 දරන අනුරාධපුර නගර සභා (විශේෂ විධිවිධාන) පනත ඉවත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 25 දරන (අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල) බලතල පැවරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එය, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් හඳුන්වනු ලබන) දිනයක ක්‍රියාත්මක වන්නේ ය.

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ බල ප්‍රදේශය සඳහා පළාත් පාලන ආයතන සංස්ථාපනය කෙරෙන බව.

**2.** (1) අමාත්‍යවරයා විසින්,—

(i) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ බල ප්‍රදේශයේ කොටසක් ව පවතින යම් ප්‍රදේශයක් නගර සභා ආඥාපනතේ කාර්යයන් සඳහා නගරයක් විය යුතු යයි ඒ ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ කරන ලදුව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශ කළ හැකි අතර ඒ ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලබන නගර සභාවට (මෙහි මින් මතු "නගර සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "අනුරාධපුර නගර සභාව" යන නාමය සහ අභිධානය පැවරිය හැකිය ;

(ii) (i) වන ඡේදය යටතේ නගර සභාව සංස්ථාපනය කිරීමෙන් පසු මණ්ඩලයේ බල ප්‍රදේශයෙන් ඉතිරි වන කොටසේ ඇතැම් ප්‍රදේශ ගම් සභා ආඥාපනතේ කාර්යයන් සඳහා ගම් ප්‍රදේශ විය යුතු යයි ඒ ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ කරන ලදුව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශ කළ හැකිය ;

(iii) (i) වන ඡේදය යටතේ නගර සභාව ද (ii) වන ඡේදය යටතේ යම් ගම් සභාවක් ද සංස්ථාපනය කිරීමෙන් පසු මණ්ඩලයේ බල ප්‍රදේශයෙන් ඉතිරි වන කොටස, අමාත්‍යවරයා විසින් නිශ්චය කරන යම් පළාත් පාලන ආයතනයක කොට්ඨාශ හෝ කොට්ඨාශවල කොටස් විය යුතු යයි නිසි ප්‍රඥප්තිය යටතේ කරන ලදුව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශ කළ හැකිය.

2—ජ 07379—8,585 (74/06)

(2) (1) වන උපවගන්තියේ (i) වන ඡේදය යටතේ සංස්ථාපනය කරන ලද නගර සභාව සම්බන්ධයෙන් නගර සභා ආඥාපනතේ විධිවිධාන ද (1) වන උපවගන්තියේ (ii) වන ඡේදය යටතේ සංස්ථාපනය කරන ලද යම් ගම් සභාවක් සම්බන්ධයෙන් ගම් සභා ආඥාපනතේ විධිවිධාන ද (1) වන උපවගන්තියේ (iii) වන ඡේදයේ සඳහන් ඉතිරි කොටස සම්බන්ධයෙන් නිසි ප්‍රඥප්තියේ විධිවිධාන ද මේ පනතේ විධිවිධානවලට යටත් ව අදාළ වන්නේය.

විශේෂ කොමසාරිස් පත් කිරීම.

3. (1) නගර සභා ආඥාපනතේ විධිවිධාන කුමක් වුව ද, නගර සභාවේ ප්‍රථම සභිකයන් තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා, ඊට අදාළ ව තත් කාලයේ බල පවත්නා ලිඛිත නීතියේ විධිවිධාන අනුව ඡන්ද විමසීමක් පැවැත්විය යුතු බවට අමාත්‍යවරයා සෑහීමට පත් වන තෙක්, නගර සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා විශේෂ කොමසාරිස්වරයකු, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය.

(2) නගර සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ යම් විශේෂ කොමසාරිස්වරයකු පත් කළ අවස්ථාවක, අමාත්‍යවරයා විසින් අන්‍යාකාරයකින් විධාන කරනු ලැබුවහොත් මිස, නගර සභාව වෙත සතු කරනු ලැබූ සියලුම දේපල ද ගිවිසුම් යටතේ වූ අයිතිවාසිකම් ද නගර සභාව සතු කරනු ලැබූ සියලුම බලතල ද ඒ විශේෂ කොමසාරිස්වරයා වෙත සතු කරනු ලැබූ සේ සලකනු ලැබිය යුතු අතර නගර සභාවේ සියලුම යුතුකම් සහ වගකීම් ඒ විශේෂ කොමසාරිස්වරයාට පවරනු ලැබ ඔහු විසින් ඉටු කරනු ලැබිය යුතුය.

පාලකයකු පත් කිරීම.

4. (1) ගම් සභා ආඥාපනතේ විධිවිධාන කුමක් වුව ද, මේ පනත යටතේ සංස්ථාපනය කරනු ලබන යම් ගම් සභාවක ප්‍රථම සභිකයන් තෝරා පත් කර ගැනීම සඳහා, ඊට අදාළ ව තත් කාලයේ බලපවත්නා ලිඛිත නීතියේ විධිවිධාන අනුව ඡන්ද විමසීමක් පැවැත්විය යුතු බවට අමාත්‍යවරයා සෑහීමට පත් වන තෙක්, ඒ ගම් සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා පාලකයකු, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය.

(2) ගම් සභාවක කටයුතු පරිපාලනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ යම් පාලකයකු පත් කළ අවස්ථාවක, අමාත්‍යවරයා විසින් අන්‍යාකාරයකින් විධාන කරනු ලැබුව හොත් මිස, ගම් සභාව සතු කරනු ලැබූ සියලු දේපල ද ගිවිසුම් යටතේ වූ සියලු අයිතිවාසිකම් ද ගම් සභාව සතු කරනු ලැබූ සියලු බලතල ද ඒ පාලක වෙත සතු කරනු ලැබූ සේ සලකනු ලැබිය යුතු අතර ගම් සභාවක සියලු යුතුකම් හා වගකීම් ඒ පාලකට පවරනු ලැබ ඔහු විසින් ඉටු කරනු ලැබිය යුතුය.

මණ්ඩලයේ දේපළ, අසිතිවාසිකම්, යුතුකම් ආදිය පළාත් පාලන ආයතන වෙත පවරා සතු කර දීම.

5. නියමිත දිනයේ සිට බල පැවැත්වෙන පරිදි—

(අ) (මෙහි මින් මතු "මණ්ඩල පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල පනතේ 34 වන වගන්තිය මගින් මණ්ඩලය වෙත පැවරුණු හෝ මණ්ඩල පනතේ 15 වන වගන්තියේ විධිවිධානවලට අනුකූල ව ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ඒ මණ්ඩලය වෙනුවෙන් අත්කර ගනු ලැබූ ද යම් රජයේ දෙපාර්තමේන්තුවක සන්තකයෙහි හෝ භාරයෙහි ඇති හෝ මණ්ඩල පනතේ 14 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් බදු දෙන ලද හෝ බදු දෙන ලදැයි සලකනු ලබන එබදු යම් දේපලක් නොවන්නා වූ ද සියලුම නිශ්චල දේපල, ඒ දේපල පිහිටියේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාවන් ඇතුළත ද ඒ පළාත් පාලන ආයතනය වෙත මෙයින් පවරා සතු කර දෙනු ලැබේ ; තවද එසේ පළාත් පාලන ආයතනය වෙත සතු කරන ලද්දා වූ, කොන්දේසි කිසිවකට යටත් ව මණ්ඩලය වෙත සතු කර දෙනු ලැබූ රජයේ නිශ්චල දේපලක් වන එබදු යම් දේපලක් ඒ කොන්දේසිවලට යටත් ව ඒ පළාත් පාලන ආයතනය විසින් සතුව තබා ගත යුතුය ;

(ආ) මේ වගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් යම් බද්දක් සම්බන්ධයෙන් නොවන, මණ්ඩලයේ එදින ඇති සියලුම අයිතිවාසිකම්, ණය, වගකීම් සහ බැඳීම් එක් එක් පළාත් පාලන ආයතනයට ඒවා සම්බන්ධ වන තාක් දුරට, ඒ පළාත් පාලන ආයතනය වෙත මෙයින් පවරා දෙනු ලැබේ ;

(ඇ) විදුලි බලය ජනනය කරමින් සම්ප්‍රේෂණය කොට සැපයීමේ කාර්යය සඳහා මණ්ඩලයේ බල ප්‍රදේශය තුළ සවිකොට නඩත්තු කරමින් ක්‍රියා කරවන ඒ මණ්ඩලයට අයත් යන්ත්‍රස්ථාන, උපකරණ හා වෙනත් දේපල ද නගර සභාවේ පරිපාලන සීමාවලට පිටතින් පිහිටි ඒ මණ්ඩලයට අයත් විදුලිබලාගාරය ද නගර සභාව වෙත මෙයින් පවරා සතු කර දෙනු ලැබේ ; තව ද

(ඈ) එක් එක් පළාත් පාලන ආයතනයට සම්පූර්ණයෙන් හෝ අඩ විශයෙන් සම්බන්ධ වූ ද, එදින පවත්නා හෝ බල පවත්නා වූ ද, මණ්ඩලය පාර්ශ්වකරුවකු වූ ද, ඒ මණ්ඩලයේ යම් නිලධරයකු හෝ සේවකයකු සමග වූ යම් ගිවිසුමක් හෝ (අ) ඡේදයෙහි සඳහන් යම් බදුකරයක් නොවන සියලුම ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම් සහ වෙනත් සාධන පත්‍ර, ඒවා ඒ එක් එක් පළාත් පාලන ආයතනයට සම්බන්ධ වන තාක් දුරට, මණ්ඩලය වෙනුවට අදාළ පළාත් පාලන ආයතනය ඒවායේ පාර්ශ්ව කරුවකු වූවාක් මෙන් සම්පූර්ණයෙන් සහ බල පැවැත් වෙන ලෙස ඒ පළාත් පාලන ආයතනයට ප්‍රති පක්ෂව හෝ පක්ෂව බල සහිත වන්නේය.

පළාත් පාලන ආයතනය වෙත සතු කෙරෙන වෙනත් දේපල.

6. (යම් රජයේ දෙපාර්තමේන්තුවක සන්තකයේ හෝ භාරයේ ඇති, නැතහොත් මණ්ඩල පනතේ 14 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් බදු දෙන ලද හෝ බදු දෙන ලදැයි සලකනු ලබන, පහත සඳහන් යම් පන්තියකට අයත් යම් දේපලක් නොවන) මණ්ඩලයේ බල ප්‍රදේශය තුළ පිහිටි ඒ පන්තිවලට අයත් සියලුම නිශ්චල දේපල, එනම්—

(අ) මුඩු බිම් සහ එළිමහන් ස්ථාන;

(ආ) ගල්, කබොක් සහ බොරළු වළවල්;

(ඇ) පොදු වැව් සහ ගඟුලු;

(ඈ) පොදු තටාක, පොකුණු සහ කාණු;

(ඉ) ගොඩනැගිලි සහිත හෝ රහිත රජයේ ඉඩම්;

(ඊ) පොදු උද්‍යාන හා වතු සහ ඒවා තුළ පිහිටි සියලුම ඉදිකිරීම් හා ගොඩනැගිලි,

ඒ දේපල පිහිටියේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාවන් තුළ ද ඒ පළාත් පාලන ආයතනය වෙත නියමිත දිනයේ සිට බල පැවැත්වෙන පරිදි මෙයින් සතු කර දෙනු ලැබේ.

සතු කිරීමෙන් රජයේ අයිතිවාසිකම් ආදියට හානියක් නොවිය යුතු බව.

7. 5 වන වගන්තියෙහි හෝ 6 වන වගන්තියෙහි ඇති කිසිවකින්—

(i) එබඳු යම් දේපලක් කෙරෙහි රජයට ඇති යම් අයිතිවාසිකමක් හෝ හිමිකමක් කෙරෙහි නැතහොත් මහජන කාර්යයන් සඳහා කවර වේලාවක වුවත් ඒ දේපල නැවත සතු කර ගැනීමට හෝ එයට සුදුස්සක් කිරීමට රජයට ඇති අයිතිවාසිකම කෙරෙහි බලපෑමක් ඇතිවන ලෙස හෝ හානියක් සිදු වන ලෙස; හෝ

(ii) රජය වෙනුවෙන් ඉඩම් පවරා දෙනු ලබන යම් යුද්ධ හමුදා බලධරයකු සතු හෝ සතුව තිබිය හැකි එබඳු යම් දේපලක, යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් කෙරෙහි බලපෑමක් ඇති වන ලෙස හෝ හානියක් සිදු වන ලෙස; හෝ

(iii) එබඳු යම් නිශ්චල දේපලක් යම් වේලාවක දී යම් බලධරයකු විසින් රජයට ආපසු භාරදීම වැළැක්වෙන ලෙස

නොසැලකිය යුතුය.

නොනිමී පවත්නා නඩු, අභියාචන ආදිය පළාත් පාලන ආයතන විසින් හෝ පළාත් පාලන ආයතනවලට විරුද්ධව අඛණ්ඩ ව පවත්වා ගෙන යා යුතු බව.

8. නියමිත දිනයේ සිට බල පැවැත්වෙන පරිදි—

(i) 5 වන වගන්තියේ (අ) ඡේදය මගින් හා 6 වන වගන්තිය මගින් ඒ පළාත් පාලන ආයතනය වෙත පවරා සතු කර දෙනු ලැබූ යම් නිශ්චල දේපලක්;

(ii) 5 වන වගන්තියේ (ආ) ඡේදය මගින් ඒ එක් එක් පළාත් පාලන ආයතනය වෙත සතු කර දෙනු ලැබූ මණ්ඩලයේ යම් අයිතිවාසිකමක්, ණයක්, වගකීමක් හෝ බැඳීමක්;

(iii) 5 වන වගන්තියේ (ඇ) ඡේදය මගින් නගර සභාව වෙත පවරා සතු කර දෙනු ලැබූ යන්ත්‍රස්ථාන, උපකරණ සහ වෙනත් දේපල; සහ

(iv) 5 වන වගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක වීම කරණකොට ගෙන ඒ එක් එක් පළාත් පාලන ආයතනයට විරුද්ධ ව හෝ එහි වාසියට බල පවත්නා යම් ගිවිසුමක්, ඔප්පුවක්, බැඳුම්කරයක්, එකඟවීමක් හෝ වෙනත් සාධන පත්‍රයක්

සම්බන්ධයෙන් මණ්ඩලය විසින් හෝ එයට විරුද්ධ ව ආරම්භ කරනු ලැබ එදින වන විට නොනිමි පවත්නා සියලුම නඩු, අභියාචන හෝ වෙනත් නඩු කටයුතු 5 වන වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඇ) ඡේදයන්හි සහ 6 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ හේතුවෙන් කතර නොවිය යුතුය, නැතහොත් නොනැවැත්විය යුතුය, නැතහොත් ඒවාට හානියක් වන ලෙස බල නොපැවැත්විය යුතුය; තව ද, ඒ අනුව, ඒවා අදාළ ඒ එක් එක් පළාත් පාලන ආයතනය විසින් හෝ ඒ එක් එක් පළාත් පාලන ආයතනයට විරුද්ධ ව නොකඩව පවත්වා ගෙන යමින් ක්‍රියාවේ යෙදවිය යුතුය.

බල ප්‍රදේශයෙහි බලපවත්නා අතුරු ව්‍යවස්ථා සහ බලපත්‍ර නොකඩ ව ම වලංගුව තිබිය යුතු බව.

9. (1) මණ්ඩලයේ බල ප්‍රදේශයේ—

(අ) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (i) වන ඡේදය යටතේ සංස්ථාපනය කරන ලද නගර සභාවේ; හෝ

(ආ) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ii) වන ඡේදය යටතේ සංස්ථාපනය කරන ලද යම් ගම් සභාවක

පරිපාලන සීමා ඇතුළතට වැටෙන යම් කොටසක බල පවත්වමින් තිබෙන සෑම අතුරු ව්‍යවස්ථාවක් ම, නගර සභා ආඥාපනත යටතේ නගර සභාව විසින් හෝ ගම් සභා ආඥාපනත යටතේ ඒ ගම් සභාව විසින් හෝ පනවන ලද අතුරු ව්‍යවස්ථාවක් වූවාක් මෙන් ඒ ප්‍රදේශයේ නොකඩව ම වලංගු ව පවතින අතර අවස්ථාවෝචිත පරිදි, නගර සභා ආඥාපනත යටතේ නගර සභාව විසින් හෝ ගම් සභා ආඥාපනත යටතේ ඒ ගම් සභාව විසින් හෝ සාදනු ලබන අතුරු ව්‍යවස්ථා මගින් එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ කළ හැකිය.

(2) මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබ, මණ්ඩලයේ බල ප්‍රදේශයේ—

(අ) නගර සභාවේ; හෝ

(ආ) යම් ගම් සභාවක

පරිපාලන සීමා ඇතුළතට වැටෙන යම් කොටසක බල පවත්වමින් තිබෙන සෑම බල පත්‍රයක් ම, නගර සභා ආඥාපනත යටතේ නගර සභාව විසින් හෝ ගම් සභා ආඥාපනත යටතේ ඒ ගම් සභාව විසින් හෝ නිකුත් කරනු ලැබුවක් මෙන් ඒ ප්‍රදේශය තුළ නොකඩව වලංගු ව පවතින්නේ ය.

(3) එබඳු යම් අතුරු ව්‍යවස්ථාවක හෝ බල පත්‍රයක හෝ මණ්ඩලය ගැන කෙරෙන සෑම සඳහනක් ම, අවස්ථාවෝචිත පරිදි, නගර සභාව හෝ ගම් සභාව ගැන කෙරෙන සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු අතර මණ්ඩලයේ සභාපති ගැන කෙරෙන සෑම සඳහනක් ම අවස්ථාවෝචිත පරිදි, නගර සභාවේ විශේෂ කොමසාරිස් ගැන හෝ අදාළ ගම් සභාවේ පාලක ගැන හෝ නගර සභාවේ සභාපති ගැන හෝ අදාළ ගම් සභාවේ සභාපති ගැන හෝ කෙරෙන සඳහනක් ලෙස ද සලකනු ලැබිය යුතුය.

මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයෝ.

10. (1) මණ්ඩලයේ සියලුම නිලධරයන් සහ සේවකයන් හැකි තාක් දුරට රාජ්‍ය සේවයට, පළාත් පාලන සේවයට හෝ යම් පළාත් පාලන ආයතනයක සේවයට අන්තර් ග්‍රහණය කළ යුතුය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සෑම නිලධරයකු ම සහ සේවකයකු ම, ක්‍රියාත්මක කළ හැකි තාක් දුරට, එකී මණ්ඩලය යටතේ පැවති අයිතිය ම පිට සහ ඒ මණ්ඩලය යටතේ දී පැවති නියමයන් සහ කොන්දේසි ම පිට සිය ධුරය දරන්නේ ය; තවද එම කාර්යයන්හි ම නැතහොත් ඊට අනුරූප කාර්යයන්හි ම යෙදී සිටින විට, ක්‍රියාත්මක කළ හැකි තාක් දුරට මණ්ඩලයෙන් ඔහු ලැබූ පඩියට හෝ පාරිශ්‍රමිකයට හෝ දීමනාවලට නොඅඩු පඩි හෝ පාරිශ්‍රමික හෝ දීමනා ඔහුට ලැබෙන අතර එකී මණ්ඩලයෙන් ලැබීමට ඔහුට හිමිකම් ඇතිව තුබූ යම් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් වේනොත්, ක්‍රියාත්මක කළ හැකිතාක් දුරට, එයට නොඅඩු විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ලැබීමට ඔහුට හිමිකම් ඇත්තේ ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් සේවයකට අන්තර් ග්‍රහණය කළ නොහැකි වූ හෝ එබඳු යම් සේවයක යෙදී සිටීමට අකැමැති මණ්ඩලයේ සෑම නිලධරයකු හෝ සේවකයකු ම අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියමයන් මත විශ්‍රාම ගත් ලෙස සලකනු ලැබිය යුතුය.

මණ්ඩලයේ මුදල් සහ යම් චංචල දේපළත් පැවරීමේ බලය.

11. අමාත්‍යවරයා විසින්—

(අ) මණ්ඩලයේ අරමුදලින් ඔහු විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයක් ; සහ

(ආ) මණ්ඩලයේ යම් චංචල දේපළක්

මේ පනත අදාළ වන එක් එක් පළාත් පාලන ආයතනයට පැවරිය යුතුය.

රජය වෙත නැවත සතු කර දෙනු ලබන ඉඩම්.

12. (1) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි දී මණ්ඩලය වෙත සතු කරනු ලැබ මණ්ඩලයේ බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ ද මේ පනත මගින් ඒ එක් එක් පළාත් පාලන ආයතනය වෙත සතු කරනු නොලැබූ ද සියලුම රජයේ ඉඩම් එම දිනයේ සිට මෙයින් රජය වෙත සතු කරනු ලැබේ.

(2) නියමිත දිනයට පෙරාතුව ප්‍රදානය කරනු ලැබ ඒ දිනයෙහි වලංගු ව පවත්නා, හා මණ්ඩලයේ බල ප්‍රදේශය ඇතුළත පිහිටි, ගොඩනැගිලි සහිත හෝ රහිත යම් රජයේ ඉඩමක සෑම බද්දක් ම ඒ ඉඩම පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපති විසින් ප්‍රදානය කරන ලද බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ දිසාපති ඒ බද්දේ පාර්ශ්වකරුවකු වූවාක් මෙන් සම්පූර්ණයෙන් සහ බල පැවැත්වෙන ලෙස ඒ බද්ද ක්‍රියාවෙහි යෙදවිය හැකිය, නැතහොත් එපරිද්දෙන් ම ඒ පිළිබඳව ක්‍රියා කළ හැකිය.

13. (1) නියෝග සෑදීමට බලය ලැබී හෝ නියමිතව ඇත්තේ යම් කරුණු සඳහා හෝ වෙනුවෙන් ද ඒ කරුණු සඳහා හෝ වෙනුවෙන් සාදනු ලබන නියෝග ඇතුළු ව මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හෝ එහි ප්‍රතිපත්ති බල ගැන්වීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයාට හැඟෙන සියලුම නියෝග අමාත්‍යවරයා විසින් සෑදිය හැකිය. නියෝග.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ කිසිම නියෝගයක්, එය ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලැබ එම අනුමත කිරීම පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තුරු බල සහිත නොවන්නේය.

14. 1961 අංක 32 දරන අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල පනත සහ 1960 අංක 28 දරන අනුරාධපුර නගර සභා (විශේෂ විධිවිධාන) පනත මෙයින් ඉවත් කරනු ලැබේ. ඉවත් කිරීම.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"අතුරු ව්‍යවස්ථාව" යන්නට රීති, නියෝග, නියම සහ නිවේදන ඇතුළත් වේ;

"නිසි ප්‍රඥප්තිය" යන්නෙන්,

(i) මහා නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට මහා නගර සභා ආඥාපනත ද

(ii) නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට නගර සභා ආඥාපනත ද

(iii) සුළු නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට සුළු නගර සභා ආඥාපනත ද

(iv) ගම් සභාවක් සම්බන්ධයෙන් වූ විට ගම් සභා ආඥාපනත ද

අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ;

"පාලක" යන්නට, ගම් සභා ආඥාපනතේ 54 වන වගන්තියේ "රජයේ නිලධරයා" යන්නට දී ඇති අර්ථය ම ඇත; තව ද

"බල ප්‍රදේශය" යන්නට, අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත.